# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## ජාතික කාබනික පාලන ඒකකය (NOCU)

### සංවර්ධන ක්‍රමෝපාය හා අන්තර්ජාතික වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) විසින්, ජාතික කාබනික පාලන ඒකකය (NOCU) හි පවතින, පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු සඳහා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) හා එක් වීමට කැමති සනාථකළ ශක්‍යතාවයන් හා වෘත්තීමය කුසලතා සහිත, ප්‍රවීණ හා අතිශය අභිප්‍රේරණයන්ගෙන් යුත්, උද්යෝගිමත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින්, අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**01. අධ්‍යක්ෂක තනතුර (HM 1-1)**

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාව / කෘෂිකර්මය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සහිත වීම

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස් උපාධියක්) ගේ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීයමය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහළොවක (15) ක "කළමනාකරණ මට්ටමේ" පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**වැටුප් පරිමාණය (HM 1-1)**

රු. 81,670/- 15 x 2270 = 115,720/- (මසකට) වැටුප්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (DMS) චක්‍රලේඛ අංක 02/2016 හි II වන ඇමුණුමේ දී ඇති උපදෙස්වලට අනුකූලව ගෙවනු ලැබේ.

රජයේ රෙගුලාසි වලට අනුකූලව, රථවාහනයක් පත්වීම්ලාභී නිලධාරියාගේ නිල හා සීමිත පෞද්ගලික පරිහරණය සඳහා සපයා දෙනු ලැබේ.

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. කෙසේවතුදු මෙම උපරිම වයස් සීමාව, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අපේක්ෂකයින් හට හා අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල පවත්වනු නොලැබේ.

**2) සහකාර අධ්‍යක්ෂක තනතුර (තත්ත්ව කළමනාකරණ) MM-1-1**

**3) සහකාර අධ්‍යක්ෂක (සම්බන්ධන / සම්බන්ධීකාරක) MM-1-1**

**සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාව / කෘෂිකර්මය හෝ අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු, රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක, මනා කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිතව කෘෂිකර්මය / තත්ත්ව කළමනාකරණ ක්ෂේත්‍රයේ (කාබනික කෘෂිකර්ම අංශයේ නම් වඩා මැනවි) අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද.

**වැටුප් පරිමාණය (HM 1-1)**

රු. 53,175/- 10 x 1,375/- - 15 x 1,910/- = 95,575/- වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (DMS) චක්‍රලේඛ අංක 02/2016 හි ඇමුණුම II හි සඳහන් උපදෙස් වලට අනුකූලව ගෙවනු ලැබේ.

**වයස : (MM 1-1)**

වයස අවුරුදු 22 කට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. කෙසේවතුදු, මෙම උපරිම වයස් සීමාව, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින් හට සහ අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපාතු ඇත.

**රැකියා පිළිබඳ විස්තර :**

රැකියාවන් පිළිබඳ විස්තර හා අතිකුත් තොරතුරු සඳහා (EDB) අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankabusiness.com වෙත පිවිසෙනු මැනවි.

**වෙනත් ප්‍රතිලාභ :**

- සේවකයා / සේවිකාව හෝ ඔහුගේ / ඇයගේ සමීපතම පවුලේ සාමාජිකයින් සඳහා වන රෝහල්ගත වීම් සහ බාහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් පූරණය කිරීම සඳහා ආකර්ෂණ වෛද්‍ය ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයක්.
- සහනදායී පොලී අනුපාතයකට, ආපදා ණය පහසුකම්
- වාර්ෂික ප්‍රසාද දීමනාව (Bonus)
- උපයෝගී කර නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම
- තෝරාගත් බස් මාර්ග සඳහා ප්‍රවාහන පහසුකම්/ ප්‍රවාහන දීමනාව.

**අයදුම්පත් ආකෘතිපත්‍ර :**

අයදුම්පත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB), 5 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ (HRM) අංශය වෙතින් හෝ EDB වෙබ් අඩවිය වන www.srilankabusiness.com වෙතින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2016 දෙසැම්බර් 07 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) හි සභාපතිනි සහ ප්‍රධාන විධායක වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් සියලු අදාළ සහතික වල පිටපත් ද සමග එවිය යුතුය. අදාළ තනතුරේ නාමය ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. අදාළ සහතික පිටපත් මගින් සිය සුදුසුකම් හා පළපුරුද්ද ආදිය සනාථ නොකරන අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවක සේවිකාවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර ලැබෙන සේ EDB (අපනයන සංවර්ධන මණ්ඩලය) වෙත අයදුම්පතේ පෙර (ප්‍රගමන) පිටපතක් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**සභාපතිනි සහ ප්‍රධාන විධායකතුමා**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB-EDB කුළුන, 42, නවම් මාවත,**
**කොළඹ 02.**
**දුරකථන : 011-2300705-11**
**ෆැක්ස් : 011-2300715**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**